'P3'


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1758/36 - 2012 මැයි 18 වැනි සිකුරාදා - 2012.05.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.– බී 36/49II.

#### පොලිස් ආඥාපනත

(53 වැනි අධිකාරය වූ) පොලිස් ආඥාපනතේ 55 වැනි වගන්තිය යටතේ අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව පොලිස්පතිවරයා විසින් සාදනු ලබන රීති.

පොලිස්පති.

2012 මැයි මස 11 වැනි දින,
කොළඹ දී ය.

රීති

1. මෙම රීති 2012 පොලිස් (පොලිස් ස්ථානවල දී නීතිඥයන් පෙනී සිටීමේ) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (53 වැනි අධිකාරය වූ) පොලිස් ආඥාපනත යටතේ පිහිටුවන ලද සෑම පොලිස් ස්ථානයකටම මෙම රීති ආදාළ වන අතර ශ්‍රී ලංකාව තුළ පිහිටි එම පොලිස් ස්ථානවල සේවය කරන කවර හෝ නිලයකට අයත් සියළු පොලිස් නිලධරයන් විසින් මෙම රීති අනුගමනය කළ යුතු ය.

3. (1) තම සේවාදායකයා වන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම් නියෝජනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා නීතිඥවරයකු වශයෙන් ශ්‍රී ලංකාවේ කවර හෝ ප්‍රදේශයක පිහිටියාවූ ද (53 වැනි අධිකාරය වූ) පොලිස් ආඥාපනත යටතේ පිහිටුවනු ලැබුවා වූ ද පොලිස් ස්ථානයක පරිශ්‍රයකට ඇතුළුවන සෑම නීතිඥවරයකුටම එම පොලිස් ස්ථානයට අනුයුක්ත කවර හෝ නිලයකට අයත් පොලිස් නිලධරයන් විසින් සුහදව සහ ආචාරශීලීව සළකනු ලැබිය යුතු අතර එම නීතිඥවරයාට සාධාරණ හා ඉවසිලිවන්ත ලෙස සවන් දිය යුතු ය.

(2) තම සේවාදායකයා වන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම් නියෝජනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ කාර්යය සඳහා යම් පොලිස් ස්ථානයකට පැමිණ සිටින නීතිඥවරයකු සම්බන්ධයෙන් ක්‍රියා කරන අතරතුරු කවර හෝ අවස්ථාවක දී එම පොලිස් ස්ථානයට අනුයුක්ත සෑම පොලිස් නිලධරයකු විසින්ම එම නීතිඥවරයාට ශාරීරික පීඩා සිදු කිරීම හෝ සැර පරුෂ වචන භාවිත කිරීම හෝ වෙනත් යම් ආකාරයක තර්ජනාත්මක ක්‍රියාවක් සිදු කිරීම නොකළ යුතු ය.

4. 3 වැනි රීතියේ සඳහන් කාර්යය සඳහා සහ එහි සඳහන් අවස්ථානුගත කරුණු යටතේ පොලිස් ස්ථානයකට පැමිණෙන නීතිඥවරයකුට, තමා නීති වෘත්තියෙහි නියැලෙන නීතිඥවරයකු බවට හඳුන්වාදෙන ලෙස එම පොලිස් ස්ථානයේ සේවය කරන පොලිස්




Certified True Copy

නිලධරයකු විසින් ඉල්ලා සිටිනු ලැබුවහොත්, තමා නීතිඥ වෘත්තියෙහි නියැලෙන නීතිඥයකු බව ඔප්පු කිරීම සඳහා හඳුනා ගැනීමේ ලේඛන වශයෙන්

(අ) එම නීතිඥවරයාගේ ජාතික හැඳුනුම්පතෙහි එම නීතිඥවරයාගේ වෘත්තිය "නීතිඥ" යනුවෙන් සඳහන් කර ඇත්නම්, එම ජාතික හැඳුනුම්පත ; හෝ

(ආ) එම නීතිඥවරයාට ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

5. යම් වරදක් සිදුකිරීම සම්බන්ධයෙන් හෝ සාමය කඩ කිරීමට අදාළ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් සැක කරනු ලබන තැනැත්තකු පොලිසිය වෙත භාරදීමේ කාර්යය සඳහා යම් නීතිඥවරයකු පොලිස් ස්ථානයකට ඇතුළුවන අවස්ථාවක, එම සැකකරු එම පොලිස් ස්ථානයේ ස්ථානභාර නිලධරයාට හෝ එම අවස්ථාවේ දී එම පොලීසියේ සිටින ඊළඟට ජ්‍යෙෂ්ඨතාවය වැඩිම නිලධරයාට භාර දෙන බවට එම නීතිඥවරයා වග බල ගත යුතු ය.

6. අදාළ අවස්ථාවේ දී එම පොලිස් ස්ථානයේ සිටින පොලිස් නිලධරයකුට නීතිඥවරයකු විසින් සැකකරුවකු භාර දෙන අවස්ථාවක, එම සැකකරු භාර දුන් දිනය හා වේලාව ද එම සැකකරුට අදාල තොරතුරු ද එසේම සැකකරු එම නීතිඥවරයා ඉදිරිපිට දී භාර දුන් බව ද පොලිස් තොරතුරු පොතෙහි සටහන් කිරීම එම පොලිස් නිලධරයාගේ කාර්යය වන්නේ ය.

7. මෙම රීති උල්ලංඝනය කරමින් යම් ක්‍රියාකාරකම්වල නියැලීමට පොලිස් සේවයේ නියුතු කිසිම පොලිස් නිලධරයකු විසින් එම පොලිස් ස්ථානයේ සේවය කරන වෙනත් යම් පොලිස් නිලධරයකුට ආධාර සහ අනුබල නොදිය යුතු ය.

8. මෙම රීතිවල පිටපත් රටපුරා පිහිටි සියළු පොලිස් ස්ථාන වලට නිකුත් කිරීමට පොලිස්පතිවරයා කටයුතු සැළැස්විය යුතු ය. මෙම රීති වල පිටපත් අදාල පොලිස් ස්ථානවල සේවය කරන සෑම පොලිස් නිලධරයකුටම ලබාදීමට ද මෙම රීතිවල අන්තර්ගත කරුණු එම නිලධරයන් වෙත දැනුම්දීම ද මෙම රීති යථා පරිදි සහ තදින්ම ක්‍රියාත්මක කරන බවට සහතිකවීම ද අදාළ පොලිස් ස්ථානවල ස්ථානභාර නිලධරයන්ගේ වගකීම වන්නේ ය.

9. (අ) පහත දැක්වෙන තැනැත්තන් හතර දෙනෙකුගෙන් සමන්විත විශේෂ කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය :-

(i) අතිරේක සොලිසිටර් ජනරාල් නිලයට වඩා අඩු නොවන නිලයකට අයත් නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධරයෙක්; ඔහු මෙම කමිටුවේ නිල බලයෙන් පත්වන සභාපතිවරයා විය යුතු ය.

(ii) ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ සභාපතිවරයා;

(iii) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ නීති අධ්‍යක්ෂ ; සහ

(iv) ජාතික පොලිස් කොමිසමේ දැනට සේවය කරන සාමාජිකයකු.

(ආ) විශේෂ කමිටුවේ රැස්වීම් අවස්ථාවෝචිත පරිදි විශේෂ කමිටුවේ සභාපතිවරයා විසින් හෝ එම විශේෂ කමිටුවේ සාමාජිකයකු විසින් කරනු ලබන විශේෂ ඉල්ලීමක් මත කැඳවනු ලැබිය යුතු ය.

(ඇ) මෙම රීති යථා පරිදි සහ නිසි පරිදි පිළිපදින බවට නියාමනය කිරීමේ සහ ඊට පහසුකම් සැළසීමේ කාර්යය ද මෙම රීති උල්ලංඝනය කිරීම පිලිබඳව පොලිස්පතිවරයාට වාර්තා කිරීමේ කාර්යය ද සාමාන්‍යයෙන් නීති වෘත්තියෙහි නියැලෙන සාමාජිකයන් සහ ශ්‍රී ලංකා පොලිස් සේවය අතර යහපත් සම්බන්ධතා ප්‍රවර්ධනය කරන සහ වැඩිදියුණු කරන සියළු ක්‍රියා කිරීම ද විශේෂ කමිටුව භාරයේ පවතින කාර්යය වේ.

(ඈ) මෙම රීති කඩ කිරීම සම්බන්ධයෙන් ද අදාළ පොලිස් නිලධරයන්ට එරෙහිව නඩු පැවරීම සම්බන්ධයෙන් ද නිර්දේශ ඉදිරිපත් කිරීමටත් කලින් කළ -

(i) නීතිපතිවරයාට

(ii) පොලිස්පතිවරයාට

(iii) ජාතික පොලිස් කොමිසමට

වාර්තා ඉදිරිපත් කිරීමටත් විශේෂ කමිටුවට හිමිකම් ඇත්තේ ය.

10. මෙම නීති කඩ කරන පොලිස් සේවයේ යම් නිලධරයකුට-

(i) පොලිස් ආඥාපනතේ 55 වැනි වගන්තියේ විධිවිධාන යටතේ දඬුවම් කරනු ලැබිය යුතු ය ; සහ

(ii) පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විනය පරීක්ෂණයකට යටත් කරනු ලැබිය යුතු ය.

06-219

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.